# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2014 අගෝස්තු මස 08 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2014.08.11 දින නිකුත් කරන ලදී)**

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන

**ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ද; ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහා ද; කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිස ද; ඉදිකිරීම් කටයුතුවලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 36.00 යි. තැපැල් ගාස්තුව : රු. 18.00 යි.

# ඉදිකිරීමේ කර්මාන්ත සංවර්ධන

එල්.ඩී.—ඕ. 59/2005.

**ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ද; ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහා ද; කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිස ද; ඉදිකිරීම් කටයුතුවලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය, ක්‍රියාත්මකවීමේ දිනය සහ අදාළත්වය.

1. (1) මේ පනත 2014 අංක      දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන, (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(2) මෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇත්නම් මිස, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ කරගෙන යනු ලබන ඉදිකිරීම් කර්මාන්තයට සම්බන්ධ සියලු කටයුතු සඳහා මේ පනත අදාළ විය යුතු ය.

2—PL 008363—475 (2014/07)

I වන කොටස

## ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම

ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය.

2. (1) මේ පනතේ II වන කොටස යටතේ පිහිටුවනු ලබන ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව විසින් ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබිය යුතු අතර, මෙම ජාතික ප්‍රතිපත්තිය, ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ කාරණා සහ එහි අරමුණුවලින් සමන්විත විය යුතු ය. ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව විසින්, ජාතික ප්‍රතිපත්තිය සකස් කළ පසු, එය අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම ජාතික ප්‍රතිත්තිය, ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනයට සමගාමීව, කලින් කල, ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ දී, සම්ප්‍රදායානුකූල දැනුම සහිත සම්පත් දායකයින් ඇතුළු ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තිකයන්ගේ සහභාගිත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

3. අමාත්‍යවරයා විසින්, 2 වන වගන්තිය ප්‍රකාරව සකසන ලද ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවශ්‍ය විය හැකි යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධාන, කලින් කල, ලබාදිය හැකි ය.

II වන කොටස

## ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව

ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව පිහිටුවීම.

4. (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) "ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය 5 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සභාවේ සංයුතිය.

**5.** (1) සභාව—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම්—

(i) සභාවේ සභාපතිවරයා විය යුතු, ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ඔහු පැමිණ නොසිටින අවස්ථාවක, ඔහු විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(ii) නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, සංවර්ධන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(iii) මහාමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යාංශයේ සංවර්ධන යටයුතු භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(iv) ජලසම්පාදන සහ ජලාපවහන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(v) වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(vi) නිවාස විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යංශයේ සංවර්ධන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු; සහ

(vii) වෘත්තීය සහ කාර්මික පුහුණු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යංශයේ සංවර්ධන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු

යන අයගෙන් සමන්විත විය යුතු ය. තව ද,

(ආ) (මෙහි මින් මතු "පත්කරනු ලැබූ සාමාජිකයන්" වශයෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් පහළොස් දෙනා, එනම්—

(i) මේ පනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති;

(ii) 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයකු;

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයකු;

(iv) 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණයන්ගේ ආයතනයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයකු;

(v) 1986 අංක 23 දරන ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නගර සැලසුම්කරුවන්ගේ ආයතනයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයකු;

(vi) 2003 අංක 42 දරන ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයකු;

(vii) 1992 අංක 64 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(viii) ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය විසින් නම් කරන ලද, පිළිවෙලින් මහා පරිමාණ සහ සුළු පරිමාණ කොන්ත්‍රාත්කරුවන් නියෝජනය කරන්නා වූ ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ නියෝජිතයන් දෙදෙනකු;

(ix) ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් නම් කරනු ලබන්නා වූ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ නියෝජිතයකු;

(x) 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු; සහ

(xi) ඉදිකිරීම්, පාරිසරික විද්‍යා, කම්කරු සම්බන්ධතා සහ මහජන සෞඛ්‍ය හෝ වෘත්තීය සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් අත්කරගත් තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හතර දෙනකු.

(2) යම් තැනැත්තකු, ඔහු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වන්නේ නම් හෝ එසේ වුවහොත්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ එසේ වීම අවසන් වුවහොත්; හෝ

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්; හෝ

(ඈ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ගත කරමින් සිටී නම් හෝ ගතකර ඇත්නම්; හෝ

(ඉ) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් හෝ එය වෙනුවෙන් සාදන ලද යම් ගිවිසුමක් යටතේ ඔහු යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඊ) සභාවේ සාමාජිකයකු ලෙස ඔහු විසින් සිය කර්තව්‍ය ඉටුකිරීමේ දී ඊට අගතියක් වන ලෙස බලපෑම් සිදුවිය හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්,

ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස ඔහු පත් කරනු ලැබීමට හෝ එවැන්නකු ලෙස නොකඩවා ක්‍රියා කිරීමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

(3) සෑම පත්කල සාමාජිකයෙක්ම මියයෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම මගින් කලින් ධුරය අත්හලහොත් මිස, ඔහු පත්

කළ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබීම යෝග්‍ය යයි සලකනු ලබන්නේ නම්, ඒ සඳහා හේතු දක්වා එසේ කරනු ලැබිය හැකි ය.

(5) යම් පත්කළ සාමාජිකයකු තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් කවර හෝ අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) යම් පත්කළ සාමාජිකයකු මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය පුරප්පාඩු වන අවස්ථාවක, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින් එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තිකයකු ලෙස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයේ නොගෙවී ඉතිරිව ඇති ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(7) යම් පත්කළ සාමාජිකයකු රෝගාතුරවීම, ශාරීරික දුබලතාවක් හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා, ඔහුට තාවකාලිකව තම කාර්ය ඉටුකිරීමට නොහැකි වන අවස්ථාවක, එම නොහැකියාව පිළිබඳ අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම්දීම එම සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. එම තොරතුරු ලැබුණු පසු ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(8) සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(9) සභාවේ යම් රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන් බහුතරයකගේ ඡන්දයෙන් සියලු තීරණවලට එළඹිය යුතු අතර, ඡන්දවල සමානත්වයක් ඇති අවස්ථාවක, සභාවේ එකී රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(10) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව වූ පාරිශ්‍රමික, සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

**සභාවේ පරමාර්ථ.**

**6.** සභාවේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය සකස් කිරීම සහ සංශෝධනය කිරීම;

(ආ) ඉදිකිරීම් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන පියවර අමාත්‍යවරයාට යෝජනා කිරීම;

(ඇ) මේ පනත යටතේ සාදනු ලැබිය යුතු යම් නියෝග සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම;

(ඈ) ඉදිකිරීම් කර්මාන්තයට සම්බන්ධිත හෝ ආනුෂංගික වන හෝ බලපෑමක් ඇතිවිය හැකි ක්‍රමෝපාය ප්‍රශ්න, ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාමය යෝජනා සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම; සහ

(ඉ) ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සහ තිරසාර පැවැත්ම සඳහා අවශ්‍ය වන වැඩපිළිවෙළ අධිකාරියට යෝජනා කිරීම.

**සභාවේ රැස්වීම්.**

**7.** (1) සභාව අවම වශයෙන් මාස තුනකට එක් වරක්වත් රැස්විය යුතු ය. එසේ වුව ද, වැදගත් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගුනහොත් අමාත්‍යවරයා විසින් විශේෂ රැස්වීමක් කැඳවිය හැකි ය.

(2) සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් අටදෙනකු විය යුතු ය.

## III වන කොටස

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**8.** (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය" යනුවෙන් හඳුන්වන අධිකාරියක් පිහිටුවිය යුතු ය. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය යටතේ එයට පවරා ඇති නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එම නමින් එය විසින් සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

**9.** (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, එය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:— අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම.

(අ) පහත සඳහන් නිලබලයෙන් පත්වන සාමාජිකයන්—

(i) ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට පහළ නිලයක් නොවන්නා වූ නිලයක් දරන නිලධරයකු;

(ii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට පහළ නිලයක් නොවන්නා වූ නිලයක් දරන නිලධරයකු;

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන් දොළොස්දෙනා—

(i) 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙක්;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනය මගින් නම් කරනු ලබන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනයේ සාමාජිකයෙක්;

(iii) 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනයේ සාමාජිකයෙක්;

(iv) 2003 අංක 42 දරන ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා උපදේශක ඉංජිනේරු සංගමය විසින් නම් කරනු ලබන එම සංගමයේ සාමාජිකයෙකු;

(v) ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ සාමාජිකයෙක්;

(vi) ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ සාමාජිකයෙක්;

(vii) සභාවේ සාමාජිකයන් නොවන වෙනත් තැනැත්තන් හයදෙනකු -

(අ) ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා කැපී පෙනෙන ලෙස දායක වූ තැනැත්තන් තිදෙනෙකු; සහ

(ආ) පහත සඳහන් ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන වෙනත් තැනැත්තන් තිදෙනෙකු -

(අ) කෘෂිකර්මය, ජලසම්පත් හෝ පාරිසරික විද්‍යාව;

(ආ) මහජන සෞඛ්‍යය හෝ වෘත්තීය සෞඛ්‍යය; සහ

(ඇ) සාමාජීය, සංස්කෘතික උරුම හෝ පාරම්පරික දැනුම.

(2) අමාත්‍යවරයා විසින්, පත්කල සාමජිකයන්ගෙන් එක් අයෙකු මණ්ඩලයේ සභාපති වශයෙන් පත්කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයන් අතරින් එක් අයෙකු අධිකරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත් කළ යුතු අතර, ඔහු පූර්ණකාලීන නිලධරයකු විය යුතු ය.

(4) යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ එසේ වුවහොත් හෝ පළාත් පාලන මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු නම් හෝ එසේ වුවහොත්; හෝ

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ එසේ වීම අවසන් වුවහොත්; හෝ

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ගත කරමින් සිටී නම් හෝ ගතකර ඇත්නම්; හෝ

(ඉ) අධිකාරිය විසින් හෝ එය වෙනුවෙන් සාදන ලද යම් ගිවිසුමක් යටතේ ඔහු යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(ඊ) මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ඔහු විසින් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී ඊට අගතිදායක ලෙස බලපෑම් සිදුවිය හැකි ආකාරයේ මුල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්,

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එවැන්නකු ලෙස නොකඩවා කටයුතු කිරීමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

(5) සෑම පත්කළ සාමාජිකයෙක් ම මියයෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම මගින් කලින් ධුරය අත්හලහොත් මිස, ඔහු පත් කළ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(6) (අ) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඊට හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය. මේ වගන්තිය යටතේ එවැනි නියමයක් කරනු ලබන්නේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, එම සාමාජිකයා විසින්, එම නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට ධුරය අත්හැරියාක් සේ සැලකිය යුතු ය.

(ආ) යම් පත්කළ සාමාජිකයකු, තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් කවර හෝ අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සංවිධානයක් විසින් නම් කරනු ලැබූ යම් පත්කළ සාමාජිකයකයකු මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම මගින් ධුරය හිස් කළ අවස්ථාවක, එකී සංවිධානය විසින් නම් කරනු ලැබිය හැකි

පරිදි වූ වෙනත් සාමාජිකයකු එම තැනැත්තා වෙනුවට අනුප්‍රාප්තිකයකු ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. සංවිධානයක් විසින් එසේ සාමාජිකයකු නම් කොට නොමැති අවස්ථාවක, අමාත්‍යාවරයා විසින්, එම සාමාජිකයා වෙනුවට එම සංවිධානයේ සුදුසු තැනැත්තකු පත් කළ යුතු ය. එසේ පත් කරනු ලබන සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉතිරි ධූර කාලය සඳහා ධූර දැරිය යුතු ය.

(ඈ) යම් සංවිධානයක් විසින් නම් කරනු ලැබූ සාමාජිකයකු සම්බන්ධයෙන් වන විට, අදාළ සංවිධානය විසින් එකී නම් කිරීම ඉල්ලා අස්කරගනු ලැබීමේ දී. එකී සාමාජිකයා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීම අවසන් වන්නේ ය.

(ඉ) රෝගාතුරවීම, ශාරීරික දුබලතාවක් හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව තම කාර්ය ඉටුකිරීමට නොහැකි වන අවස්ථාවක, එම නොහැකියාව පිළිබඳ අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දීම එම සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. එම තොරතුරු ලැබුණු පසු ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා අදාළ සංවිධානය විසින් නම් කරනු ලබන වෙනත් යම් තැනැත්තෙක් හෝ ඒ සාමාජිකයා යම් සංවිධානයක් විසින් නම් කළ තැනැත්තකු නොවන විටෙක වෙනත් යම් සුදුසු තැනැත්තෙකු හෝ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(7) අමාත්‍යවරයා විසින්, හේතු දක්වා මණ්ඩලයේ සභාපතිවරයා හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) සභාපතිවරයා හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා රෝගාතුරවීම, ශාරීරික දුබලතාවයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තාවකාලිකව තම ධූරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකි

වන අවස්ථාවක, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු නම් කළ හැකි ය.

(9) සභාපතිවරයා හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා තත්කාර්ය සඳහා අමාත්‍යාවරයා අමතන ලිපියක් යැවීමෙන් කවර හෝ අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එවැනි ඉල්ලා අස්වීමක්, අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගත් විට බලාත්මක විය යුතු ය.

(10) සභාපතිවරයාගේ සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව අවුරුදු තුනක් විය යුතු ය. සභාපතිවරයා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා නැවත පත් කරනු ලැබීමට යෝග්‍ය විය යුතු ය.

(11) සභාපතිවරයා, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා සහ මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(12) මණ්ඩලයේ සභාපතිවරයා, මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් යම් සාමාජිකයෙක් රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

**10.** (1) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු අතර, මණ්ඩලය, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත් ව මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ ක්‍රියාපටිපටිය සහ එම රැස්වීම්වල කටයුතු කළයුතු ආකාරය විධිමත් කළ හැකි ය. මණ්ඩලයේ රැස්වීම්.

(2) ඡන්ද සංඛ්‍යාවේ සමානත්වයක් ඇති අවස්ථාවක, සභාපතිවරයා හෝ යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයාට සිය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මණ්ඩලය, සෑම මසකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ රැස්විය යුතු ය.

(4) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීම හේ එයට යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම

පමණක්, මණ්ඩලයේ යම් ක්‍රියාවක්. තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

**11.** (1) අධිකාරියේ මුද්‍රාව:—

(අ) අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා භාරයේ තිබිය යුතු ය;

(ආ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) අධිකාරියේ අවසරය ඇතිව සහ එහි සභාපති සහ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිඳු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

(2) අධිකාරිය විසින්, අධිකාරියේ මුද්‍රාව තබනු ලැබූ ලේඛන සහ සාධනපත්‍රවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

අධිකාරියේ පරමාර්ථ.

**12.** අධිකාරියේ පරමාර්ථ පහත පරිදි විය යුතු ය:—

(අ) 3 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම;

(ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනය ප්‍රබෝධමත් කිරීම, ප්‍රතිසංවිධානය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයේ පරදු දරන්නන්ට ක්‍රමෝපාය නායකත්වයක් ලබාදීම;

(ඇ) ඉදිකිරීම් කර්මාන්තයේ පරදු දරන්නන්, කලින් කල, නියම කරනු ලැබිය හැකි පරිදි ලියාපදිංචි කිරීම සහ එම ලියාපදිංචිය අලුත් කිරීම;

(ඈ) බලශක්ති එලෝත්පාදක ගොඩනැගිලි සහ ව්‍යුහ සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර වර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) ඉදිකිරීම් කර්මාන්තය සහ එහි සංවර්ධනට අදාළ කවර හෝ කාරණා සම්බන්ධයෙන් සුදුසු පර්යේෂණ කිරීම සහ පර්යේෂණ කටයුතු පළකිරීම සහ ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඊ) අනෙකුත් අදාළ අධිකාරීන් විමසා, ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් සකස් කිරීම සහ එම ප්‍රමිතීන් අනිවාර්ය ප්‍රමිතීන් සහ ස්වේච්ඡා ප්‍රමිතීන් වශයෙන් වර්ගීකරණය කිරීම; සහ

(උ) අධිකාරිය විසින් සකස් කරනු ලබන පරිදි වූ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ වන ආචාරධර්ම පද්ධති, පරිචය, ක්‍රියා පටිපාටි සහ වැඩපිළිවෙල සහ ලේඛන සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම.

අධිකාරියේ කර්තව්‍ය.

13. අධිකාරියේ කර්තව්‍ය පහත දක්වා ඇති පරිදි විය යුතු ය:—

(අ) අමාත්‍යවරයා විසින් 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධිවිධානවලට අනුකූලව 2 වන වගන්තිය යටතේ සකස් කරන ලද ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම;

(ආ) ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා ක්‍රමෝපාය සම්පාදනය කිරීම;

(ඇ) ඉදිකිරීම් කර්මාන්තයට අදාළ දෑ සහ තොරතුරු රැස්කොට පළ කිරීම;

(ඈ) ඉදිකිරීම් කර්මාන්තයට අදාළ යහපත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අනෙකුත් අදාළ ආයතන විමසා, ඉදිකිරීම් සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය සහ ශිල්පකරණය ඇතුළු ඉදිකිරීම් වැඩවල ප්‍රමිති පවත්වාගෙන යෑම;

(ඊ) ඉදිකිරීම් කර්මාන්තයට අදාළ කාර්ය, භාණ්ඩවල හා සේවාවන් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා යම් අදාළ අධිකාරියකට නිර්දේශ කිරීම;

(උ) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ අංශවල කැපී පෙනෙන ජයග්‍රහණ උදෙසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් වෙත ජාතික සම්මාන ප්‍රදානය කිරීම සහ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි, නිර්මිතයන් සහ ඉදිකිරීම් ක්‍රමවේද නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ජතික සම්මාන ප්‍රදානය කිරීම විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඌ) ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තීමයභාවය සහ සේවා නියුක්තිය සම්බන්ධ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම;

(එ) ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඒ) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම සඳහා විධිවිධාන සැලස්වීම;

(ඔ) මූල්‍යමය සහ අළෙවි හැකියාවන් යටතේ දේපල සංවර්ධනකරුවන් ශ්‍රේණිගත කිරීම සහ ඔවුන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම;

(ඕ) ගිවිසුමක ආරවුල් සම්බන්ධයෙන් තීරකවරු ලෙස කටයුතු කිරීමට සුදුසු තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ක) ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක්, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට පවත්වාගෙන යෑම;

(ග) 26 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යාම;

(ච) විද්‍යුත් යාන්ත්‍රික සවිකිරීම්, වෙනත් ගොඩනැගිලි තිරවුරු සහ ඉදිකිරීම්වලට අදාළ වෙනත් යම් අංශයක් සම්බන්ධයෙන් විශේෂඥභාවයක් ලත් කොන්ත්‍රාත්කරුවන් ලියාපදංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඡ) මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ඉදිකිරීම් ශිල්පයන්හි නිපුන ශ්‍රමිකයන් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ට ශිල්පීය හැඳුනුම්පත් නිකුත් කිරීමට විධිවිධාන සැලැස්වීම;

(ට) රටේ දැනට තිබෙන නිශ්චිතව සඳහන් කරනු ලබන බර ඉදිකිරීම් පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ සම්බන්ධ නාමාවලියක් පවත්වාගෙන යෑම;

(ඪ) ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය වන්නා වූ මානව සම්පත් සංවර්ධනය සහ පුහුණු කිරීමේ කටයුතු භාර ගැනීම සහ ඒවා සුසාධනය කිරීම සහ අදාළ ජාතික නියෝජ්‍යායතනවල එකඟත්වය ඇතිව පුහුණුව සහ ඇගයීම සඳහා ජාතික ප්‍රමිති සංවර්ධනය කිරීම;

(ණ) ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු නිපුණ ශ්‍රමිකයන්ගේ දක්ෂතාවය තක්සේරු කිරීම සහ නිපුණතා සහතික නොමැති එවැනි නිපුණ ශ්‍රමිකයන්ට යෝග්‍යතා සහතික නිකුත් කිරීම;

(ත) ඉදිකිරීම් කර්මාන්තයේ පවත්නා මානව සම්පත් අවශ්‍යතා සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ අලුතින් ඉස්මතු වන ශිල්පයන් සඳහා විෂයධාරා සංවර්ධනය කිරීම, සුසාධනය;

(ද) ඉදිකිරීම් කර්මාන්තයට අදාළ දේශීය උපදේශක සේවා ප්‍රවර්ධනය කිරීම සහ සුසාධනය සහ දේශීය උපදේශක ව්‍යාපාර ආයතනය මගින් වෙනත් රටවල උපදේශ සේවා භාර ගැනීම;

(න) වෙනත් රටවල ඉදිකිරීම් කටයුතු භාරගනු ලබන දේශීය වශයෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම සහ සුසාධනය;

(ප) ඉදිකිරීම් කර්මාන්තයට සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් තොරතුරු සහ උපදේශක සේවා සැපයීම;

(ඛ) පරිසර හිතකාමී, යෝග්‍ය, පිරිවැය කාර්යක්ෂම සහ දැරිය හැකි නව තාක්ෂණයන් යොදා ගැනීම සහ ව්‍යාප්ත කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම;

(ම) ඉදිකිරීම් කර්මාන්තයේ යම් ද්‍රව්‍ය, පිරියත සහ යන්ත්‍රෝපකරණ අවශ්‍යතා සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සහ ඉදිකිරීම් වැඩවල දී දේශීය නිෂ්පාදන සංවර්ධනය කිරීම හා භාවිතයට ගැනීම දිරිමත් කිරීම;

(ය) ඉදිකිරීම් කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ භාර ගැනීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය සහ ඉදිකිරීම් කර්මාන්තයේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම;

(අඅ) ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන ආයතනවල ක්‍රියාකාරකම් වර්ධනය කර ගැනීම සඳහා එම ආයතනවලට සහාය වීම;

(ආආ) යම් වයස්ගත හෝ වෙනස් වූ හැකියාවන්ගෙන් යුතු වූ පුද්ගලයන්ට පහසුවෙන් ඇතුල්විය හැකි සහ භාවිත කළ හැකි වන ආකාරයෙන් යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවශ්‍ය වන අවස්ථාවක එවැනි ඉදිකිරීමක් ප්‍රවර්ධනය කිරීම;

(ඇඇ) ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා වෙනත් යම් ක්‍රියාකාරකම් භාර ගැනීම හෝ ඒවාට සහාය වීම;

(ඈඈ) ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ ජාතික දත්ත සැකසුමක් පවත්වාගෙන යෑම;

(ඉඉ) ඉදිකිරීම් කර්මාන්තයේ සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන් සහ ඉදිකිරීම් කර්මාන්තය විෂයයෙහි අන්තරායදායී ද්‍රව්‍ය භාවිතා කිරීම විධිමත් කිරීම සඳහා අදාළ අධිකාරීන් වෙත නිර්දේශ කිරීම;

(ඊඊ) ඉදිකිරීම් සහ කළමනාකරණ ක්‍රියාවලිය සහ නියමිත කොන්දේසි සහ අනුමත ප්‍රමිතීන්ට අනුකූලවීම ද ඇතුළු ඉදිකිරීම් වැඩවල ප්‍රතිඵල තාක්ෂණිකව විගණනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමිති සකස් කිරීම; සහ

(උඋ) මෙම පනතේ කාර්ය සඳහා යම් ව්‍යාපෘතියක් හෝ කටයුත්තක් "හඳුනාගත් ඉදිකිරීම් වැඩක්" ලෙස ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

අධිකාරියේ බලතල.

**14.** අධිකාරියට, එහි කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය වන හෝ ආනුෂංගික වන ආකාරයේ බලතල තිබිය යුතු අතර, විශේෂයෙන් පහත දැක්වෙන බලතල තිබිය යුතු ය; එනම්—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපල යම් ආකාරයකින් අත්පත් කර ගැනීම, දැරීම, බද්දට දීම හෝ ගැනීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම;

(ආ) මේ පනතේ කාර්ය සඳහා නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ එම නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඇ) අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත්වලට කෙලින්ම හෝ තත්කාර්ය සඳහා බලය දෙනු ලැබූ යම් සේවකයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළත් වී ඒවා ඉටු කිරීම;

(ඈ) මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමතය ඇතිව යම් රජයේ බැංකුවක හෝ වෙනත් යම් මූල්‍ය ආයතනයක ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ වසා දැමීම;

(ඉ) අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණ ණයට ගැනීම;

(ඊ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත මූලාශ්‍රයන්ගෙන් චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ප්‍රදාන, පරිත්‍යාග සහ රික්තවරණ පිළිගැනීම සහ ලබා ගැනීම සහ ඒවා අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා පාවිච්චි කිරීම:

එසේ වුව ද, සියලු විදේශීය ප්‍රදාන, පරිත්‍යාග සහ රික්තවරණ සම්බන්ධයෙන් අධිකාරිය විසින් මුදල් විෂයය පවරා ඇත්තේ කවර අමාත්‍යවරයෙකුට ද, එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(උ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම;

(ඌ) ඉදිකිරීම් කර්මාන්තයේ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සහ එම ලියාපදිංචි කිරීම අලුත් කිරීම හෝ අධිකාරිය විසින් ඉටු කරනු ලබන යම් සේවයක් සඳහා නියම කරනු ලැබිය හැකි ගාස්තු හෝ අය කිරීම පැනවීම; සහ

(එ) අධිකාරියේ අදහසට අනුව, අධිකාරියේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා හෝ දේ, කලින් කල, ඉටු කිරීම.

අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා.

**15.** (1) ඉදිකිරීම් සහ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ සුදුසුකම් ඇති, අධ්‍යක්ෂ-ජනරාල්වරයකු අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා, මණ්ඩලයේ සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් ව අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්ගේ පරිපාලනය සහ පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

**16.** අධිකාරිය විසින්, මේ පනත යටතේ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි සලකනු ලබන යම් නිලධරයන්

සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි අතර, එවැනි නිලධරයන් සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, ඔවුන්ගේ සේවා කොන්දේසි සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම නිශ්චය කළ යුතු ය.

රජයේ නිලධරයන් පත් කිරීම.

17. (1) අධිකාරියේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඒ සඳහා ගිවිසුමකට ඇතුළු වී ඇති තැනැත්තෙකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුම යටතේ එම තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අධිකාරියේ ඉල්ලීම පරිදි, පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලය ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

ඉදිකිරීම් ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා කමිටු පත් කිරීම.

18. (1) ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිති, රීති සහ නියෝග සකස් කිරීම සඳහා අධිකාරිය විසින් අදාළ අධිකාරීන් විමසා, පහත දැක්වෙන කමිටු පත් කරනු ලැබිය යුතු ය.

(අ) තාක්ෂණික ප්‍රමිති, රීති සහ නියෝග පිළිබඳ කමිටුව;

(ආ) පරිසර සහ මහජන සෞඛ්‍ය ප්‍රමිති පිළිබඳ කමිටුව; සහ

(ඇ) ආචාරධර්ම සහ සමාජීය වගකීම් ප්‍රමිති පිළිබඳ කමිටුව.

(2) අධිකාරිය විසින්, අදාළ වෘත්තීය සහ අධ්‍යයන මණ්ඩල මෙන්ම සමාජීය සහ පාරිසරික සංවිධාන විමසා එම කමිටුවල සාමාජිකයන් තෝරා ගනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ අධිකාරියේ අරමුදල

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල.

19. (1) (මෙම පනතේ "සංවර්ධන අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සංවර්ධන අරමුදලට පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය යුතු ය:—

(අ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ලැබෙන ණය මුදල් කුලී මුදල්, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් සංවර්ධන අරමුදලට ලැබිය හැකි සියලු මුදල්;

(ආ) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන බද්ද ලෙස රැස් කරගනු ලැබූ සියලු මුදල්.

(3) පහත මාර්ගෝපදේශවලට යටත් ව, මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සංවර්ධන අරමුදල විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා නියමිත මුදල් සංවර්ධන අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(අ) අරමුදලින් සියයට පනහකට (50%) වැඩි ප්‍රමාණයක කුඩා පරිමාණ කොන්ත්‍රාත්කරුවන් සහ ස්වයං රැකියාවල නියුතු ලියාපදිංචි ශිල්පීන්ගේ සුභසිද්ධිය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය;

(ආ) ඉදිකිරීම් කර්මාන්තයට සම්බන්ධිත පර්යේෂණ සහ ප්‍රකාශන පළ කිරීම් සඳහා අරමුදලින් සියයට පහකට (5%) නොඅඩු මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබිය යුතු ය;

(ඇ) පරිසර හිතකාමී සහ පිරිවැය අඩු ඉදිකිරීම් තාක්ෂණ නව නිපදවීම, භාවිතය සහ ප්‍රචාරන ඵලදායී කිරීම සහ දිරිගැන්වීම සඳහා අරමුදලින් සියයට පහකට (5%) නොඅඩු මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබිය යුතු ය;

(ඈ) වෙනත් යම් නීතියක් යටතේ වෙනත් යම් ආකාරයක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන, අධිකාරියේ ලියාපදිංචි වී ඇති ශිල්පීන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සමග දීර්ඝ කාලීන රක්ෂණයක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිදි අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් වෙන් කරනු ලැබිය යුතු ය.

(4) (අ) මෙම වගන්තියේ කාර්ය සඳහා ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයා විසින් "ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන බද්ද" ලෙස හඳුන්වනු ලබන බද්දක් පැනවිය යුතු ය. එසේ පනවනු ලබන බදු මුදලේ අනුප්‍රමාණය, ව්‍යාපෘතිවල ඉදිකිරීම් පිරිවැයෙහි ප්‍රතිශතයක් වන ලෙස, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු ය. එසේ නිශ්චය කරනු ලබන සෑම අනුප්‍රමාණයක් ම අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින් මෙම වගන්තියේ (අ) ඡේදය යටතේ නිශ්චය කරනු ලබන බදු අනුප්‍රමාණය, කලින් කලට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව ප්‍රකාශයට පත් කළ යුතු ය. මේ ඡේදය යටතේ සාදනු ලබන යම් නියමයක් එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(ඇ) මේ වගන්තිය යටතේ පනවනු ලැබූ බදු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එකතු කරගනු ලැබිය යුතු අතර, එය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදලට බැර කළ යුතු ය.

සංවර්ධන අරමුදලේ කළමනාකරණය සහ පරිපාලනය.

**20.** (1) සංවර්ධන අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන කටයුතු ඉදිකිරීම් පිළිබඳ ජාතික උපදේශක සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, සංවර්ධන අරමුදල, 19 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඇ) වන ඡේදවලට යටත් ව කළමනාකරණය කළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

ගිණුම් විගණනය.

**21.** රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සංවර්ධන අරමුදලේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනත අදාළ කිරීම.

**22.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, සංවර්ධන අරමුදලේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අධිකාරියේ අරමුදල.

**23.** (1) අධිකාරියට, (මේ පනතේ "අධිකාරියේ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන) එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2)(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ අනෙකුත් වේතන පියවීම සඳහා අවශ්‍ය වන මුදල් ද ඇතුළුව අධිකාරියේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින්, කලින් කල, වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමේ දී අධිකාරියට ලැබිය හැකි පරිදි වූ සියලු මුදල්; සහ

(ඇ) ණය, කුලී, පරිත්‍යාග, ත්‍යාග, ප්‍රදාන හෝ අයභාර සහ අධිකාරියේ වත්කම් විකිණීම මගින් අධිකාරියට ලැබිය හැකි පරිදි වූ සියලු මුදල්,

අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මෙම පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් අධිකාරියේ අරමුදලෙන් ගෙවිය යුතු ය.

ගිණුම් විගණනය.

**24.** අධිකාරියේ අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කර ගැනීම.

**25.** අධිකාරියේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව අදාළ විය යුතු ය.

## V වන කොටස

## සුදුසුකම්ලත් තැනැත්තන්

සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමලේඛනය.

**26.** (1) අධිකාරිය විසින් සහතිකලත් කමිටු මගින් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි සුදුසුකම්ලත් තැනැත්තන් වශයෙන් නිර්දේශ කරනු ලබන තැනැත්තන්ගේ (මෙහි මින් මතු "සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(අ) 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරු ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විමසා, ඉංජිනේරු විද්‍යාව;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය විමසා, වාස්තු විද්‍යාව;

(ඇ) 2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය විමසා, ප්‍රමාණ සමීක්ෂණය;

(ඈ) අදාළ අධ්‍යයන සහ වෘත්තීය අංශ විමසා පාරිසරික සහ මහජන සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යා; සහ

(ඉ) ඉහත (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල නිශ්චිතව දක්වා නොමැති අදාළ අධ්‍යයන හෝ වෘත්තීය මණ්ඩල විමසා, කලින් කල, නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්ෂේත්‍රයක්;

(2) (අ) (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් වෘත්තීය මණ්ඩලයක සාමාජිකයන් නොවන තැනැත්තන් සහ (1) වන උපවගන්තියේ (ඈ) සහ (ඉ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ක්ෂේත්‍රවලට අයත් වන තැනැත්තන් ලියාපදිංචි කිරීමේ නිර්ණායක, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(ආ) (1) වන උපවගන්තියේ (අ) (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් වෘත්තීය මණ්ඩලයක සාමාජිකයකු වන යම් තැනැත්තෙකු මේ පනත යටතේ දක්වා ඇති ලියාපදිංචි කිරීමේ නිර්ණායකවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) සුදුසුකම්ලත් තැනැත්තෙකු වශයෙන් ලියාපදිංචි වීමට අදහස් කරන යම් තැනැත්තෙකු ඒ සඳහා අධිකාරිය වෙත ඉල්ලීමක් කළ යුතු ය. අධිකාරිය විසින් එම ඉල්ලුම්පත්‍රය ලැබුණු විට—

(අ) (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් වෘත්තීය මණ්ඩලයක සාමාජිකයෙකු වන යම් තැනැත්තෙකුගෙන් ලැබුණු ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, එම තැනැත්තා මේ පනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු වශයෙන් ලියාපදිංචිකොට එම තැනැත්තාගේ නම සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ආ) (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් වෘත්තීය මණ්ඩලයක සාමාජිකයෙකු නොවන යම් තැනැත්තෙකු සහ (1) වන උපවගන්තියේ (ඈ) සහ (ඉ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ක්ෂේතවලට අයත් යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට, එම ඉල්ලුම්පත්‍රය සහතිකලත් කමිටුවල නිර්දේශය ලබා ගැනීම සඳහා එම කමිටුවලට යොමු කළ යුතු ය.

(4) අධිකාරිය විසින්, සහතිකලත් කමිටුවෙන් (3) වන උපවගන්තිය යටතේ අධිකාරියට කරන ලද නිර්දේශය මත පදනම්ව, එසේ නිර්දේශ කරන ලද තැනැත්තන් "සුදුසුකම්ලත් තැනැත්තන්" ලෙස පත් කරනු ලැබිය යුතු අතර, එම තැනැත්තන්ගේ නම් සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමලේඛනයේ ඇතුළත් කිරීමට සැලැස්විය යුතු ය.

(5) සුදුසුකම්ලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ සහ එම ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාපටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු අතර, එම තැනැත්තාගේ නම සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමලේඛනයේ ඇතුළත් කළ පසු එම එක් එක් සුදුසුකම්ලත් තැනැත්තාට ලියාපදිංචි අංකයක් නිකුත් කළ යුතු ය. එම නාමලේඛනය යම් තැනැත්තකු විසින් කාර්යාල වේලාවන්හි දී ගෙවීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා අධිකාරියේ කාර්යාලයෙන් ලබාගත හැකි විය යුතු ය.

සහතික ලත් කමිටු සහ එහි කර්තව්‍ය.

**27.** (1) අධිකාරිය විසින්, අදාළ වෘත්තීය සහ අධ්‍යයන මණ්ඩලවල සාමාජිකයන් අතුරින් පහළොස් දෙනෙකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත සහතිකලත් කමිටු පත් කරනු ලැබිය යුතු ය.

(2) වෘත්තීය සහ වෘත්තීමය ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ වර්ගීකරණය කිරීම, මේ පනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තන් ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද, එම ක්ෂේත්‍රයන්හි පරිචය සහ මේ පනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තන් ලෙස ලියාපදිංචි විය හැකි තැනැත්තන් කවුරුන් ද යන්න අධිකාරියට නිර්දේශ කිරීම සහතිකලත් කමිටුවල කර්තව්‍ය වන්නේ ය.

හඳුනාගත් ඉදිකිරීම වැඩවල සුදුසුකම්ලත් තැනැත්තන් පමණක් නියුතු විය යුතු බව.

**28.** යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩ කරගෙන යාම, නිර්මාණ කිරීම, අවශ්‍ය ගිවිසුමක ලේඛන සැකසීම සහ එම නියමිත ඉදිකිරීමේ වැඩවල අධීක්ෂණය ද යනාදී කාර්ය සඳහා හෝ ඒවායේ නියුක්ත කරලීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තකු හැර වෙනත් තැනැත්තෙකු පත් කරනු නොලැබිය යුතු ය.

වාර්තා පවත්වාගෙන යා යුතු බව.

**29.** අධිකාරිය විසින් හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධ වාර්තා පවත්වාගෙන යා යුතු ය.

සුදුසුකම්ලත් තැනැත්තන් ප්‍රමිතිවලට අනුකූල විය යුතු බව.

**30.** සුදුසුකම්ලත් සෑම තැනැත්තෙකුම අදාළ මණ්ඩල හෝ සංවිධාන මගින් පවත්වාගෙන යන නිර්මාණ කිරීම සහ ලේඛනවල ප්‍රමිතීන් හා අනුකූල විය යුතු අතර, අදාළ මණ්ඩල හෝ සංවිධාන මගින් එවැනි ප්‍රමිතීන් පවත්වාගෙන යනු නොලබන අවස්ථාවක, එම මණ්ඩල හෝ සංවිධානවල සාමාජිකයන් වන සුදුසුකම්ලත් තැනැත්තන්, හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් අධිකාරිය විසින්, කලින් කල, නියම කරනු ලබන ප්‍රමිතින්වලට අනුකූල විය යුතු ය.

හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා පළාත් පාලන ආයතන අනුමතය.

**31.** වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් අදාළ වන වාස්තු විද්‍යාත්මක, ව්‍යුහමය, විදුලි සහ ජල සම්පාදන, මළාපවහන සහ එම හඳුනාගත් ඉදිකිරීම් වැඩට අදාළ අනෙකුත්, සැලසුම් සහ සේවාවන් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් සිදු කරනු ලබන්නේ නම් මිස එම ඉදිකිරීම් කටයුත්ත සම්බන්ධයෙන් ගොඩනැගිලි අනුමත කිරීම් සඳහා වූ ඉල්ලීමක් කිසිදු පළාත් පාලන ආයතනයක් විසින් භාර නොගත යුතු ය.

සුදුසුකම්ලත් තැනැත්තන්ට එරෙහිව විමර්ශණ පැවැත්වීම.

**32.** (1) යම් සුදුසුකම්ලත් තැනැත්තකුට එරෙහිව-

(අ) යම් වෘත්තීයමය නොසැලකිල්ලක්, නිපුණතාවක් නොමැතිවීම හෝ යම් ආචාරාත්මක හෝ සමාජ ප්‍රමිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්;

(ආ) දුරාචාරයක්, විෂමාචාරී ක්‍රියාවක්, වංචාවක් හෝ වංකභාවය සම්බන්ධයෙන් යන පැමිණිල්ලක්;

(ඇ) ස්වකීය ලියාපදිංචිය යම් නියම සහ කොන්දේසිවලට යටත් ව ලබා දී ඇති අවස්ථාවක, එම නියම සහ කොන්දේසි කඩකිරීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලක්,

අධිකාරිය වෙත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පැමිණිල්ලක් සිදුකර ඇත්තේ යම් සුදුසුකම්ලත් තැනැත්තකුට එරෙහිව ද, එම සුදුසුකම්ලත් තැනැත්තා 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් වෘත්තීයමය මණ්ඩලයක සාමාජිකයකු වන අවස්ථාවක දී, අධිකාරිය විසින් එම පැමිණිල්ල, අදාළ වෘත්තීයමය මණ්ඩලයට යොමු කළ යුතු ය.

(3) අදාළ වෘත්තීයමය මණ්ඩලය විසින්, පැමිණිල්ලක් ලැබුණු විට, (2) වන උපවගන්තිය යටතේ එසේ යොමු කළ කාරණය පිළිබඳ විමර්ශණයක් සිදු කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් ආවරණය වූ කරුණු හැකි පහසු ඉක්මණින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විනාශානුකූල පියවර ගෙන ඒ සම්බන්ධයෙන් නැවත අධිකාරියට වාර්තා කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අදාළ වෘත්තීය මණ්ඩලය විසින් කිසිදු නිර්දේශයක් කරනු නොලබන අවස්ථාවක, අධිකාරිය විසින් එම කාරණය විමර්ෂණය කර ඒ පිළිබඳව උචිත පියවරක් ගනු ලැබිය යුතු ය.

(5) යම් වෘත්තීයමය මණ්ඩලයක සාමාජිකයෙකු නොවන යම් සුදුසුකම්ලත් තැනැත්තෙකුට එරෙහිව වන පැමිණිල්ලක්, අධිකාරිය විසින් නියම කරනු ලබන අධිකාරියේ විනය ක්‍රියාපටිපාටිය අනුව විමර්ෂනය කළ යුතු ය.

විදේශීය උපදේශකයන් යෙදවීම.

**33.** (1) යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස විදේශීය උපදේශකයකු යෙදවීමට අවශ්‍ය යම් තැනැත්තකු තාවකාලික ලියාපදිංචියක් සඳහා අධිකාරිය වෙත ඉල්ලීමක් කළ යුතු ය.

(2) සෑම විදේශීය උපදේශකයකුම, සුදුසුකම්ලත් තැනැත්තකු වශයෙන් ශ්‍රී ලංකාවේ යම් උපදේශක සේවයක නියුතු වීමට පෙරාතුව ලියාපදිංචි අනුමත ව්‍යාපෘතියකට සම්බන්ධවීමේ කොන්දේසිය මත එම ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීමට යටත් ව, සුදුසුකම්ලත් තැනැත්තෙකු ලෙස තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා අධිකාරිය වෙත ඉල්ලුම් කළ යුතු ය. එම ලියාපදිංචි වීමේ ක්‍රියා පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි වීමේ සහතිකයක් ලබා නොගෙන සුදුසුකම්ලත් තැනැත්තෙකු වශයෙන් යම් හඳුනාගත් ඉදිකිරීමේ වැඩක් සිදු කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) මේ වගන්තියේ විධිවිධාන, ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපෘතියක් යටතේ යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුතු වන යම් විදේශ උපදේශකයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. එසේ වුව ද, අධිකාරිය විසින්, එම උපදේශකයන් සේවයේ යොදවන ආයතනවලින් මේ පනතේ 55 වන වගන්තියේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ යම් තොරතුරු ලබාගත හැකි අතර, එම ආයතන, මේ වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමකට අනුකූල විය යුතු ය.

VI වන කොටස

## කොන්ත්‍රාත්කරුවන්, දේපල සංවර්ධනය කරන්නන් ආදීන් ලියාපදිංචි කිරීම

**කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනය.**

**34.** අධිකාරිය විසින්, කාර්යාල වේලාවන්හි දී ඕනෑම තැනැත්තකු විසින් ගෙවීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා ලබාගත හැකි තත් කාර්ය සඳහා අධිකාරිය විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සහ ආකෘතියට අනුව වන (මෙහි මින් මතු "කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන) කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

**කොන්ත්‍රාත් කරුවන් සඳහා වන ලියාපදිංචි වීමේ සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාපටිපාටිය.**

**35.** (1) කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක්, නියම කරනු ලැබිය හැකි ආකාරයට හා නියම කරනු ලැබිය හැකි ගාස්තු ද සමග අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා වන ඉල්ලුම්පත්‍ර සලකා බැලීම සඳහා වෘත්තීය මණ්ඩල සහ කොන්ත්‍රාත්කරුවන්ගේ සංගම් විමසා අධිකාරිය විසින් කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය. එම ලියාපදිංචි කිරීම සඳහා වන උපමාන නියම කරනු ලබන පරිදි විය යුතු අතර, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් පිළිගැනීමට ලක්වන ලෙස පිරිවැය එලදායි නිර්මාණාත්මක තාක්ෂණික ක්‍රමවලට අදාළ ප්‍රතිපාදන විශේෂිතව ම ඇතුළත් විය යුතු ය.

(3) අධිකාරිය විසින් යම් තැනැත්තකු කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි කර ඇති අවස්ථාවක, එම තැනැත්තාට ලියාපදිංචි කිරීමේ අංකයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය එම සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා වලංගු වන අතර, නියමිත අලුත් කිරීමේ ගාස්තුව ගෙවා තත්කාර්ය සඳහා ඉල්ලීමක් කිරීමේ දී අලුත් කරනු ලැබිය හැකි ය.

කොන්ත්‍රාත් කරුවකුගේ ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

**36.** (1) යම් කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහි පැමිණිල්ලක් අධිකාරිය වෙත ලැබෙන අවස්ථාවක, අධිකාරිය විසින්, එම පැමිණිල්ල, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විශිෂ්ට තැනැත්තන්ගෙන් සමන්විත විනය කමිටුවකට යොමු කළ යුතු අතර, එම විනය කමිටුව විසින් ඒ සම්බන්ධයෙන් විමර්ශණය කොට අධිකාරිය වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය. විනය කාර්යපටිපාටිය සඳහා වන මාර්ගෝපදේශ නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ පත් කරනු ලබන විනය කමිටුව, සිය නිර්දේශ අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමේ දී පහත දැක්වෙන කාරණා සැලකිල්ලට ගත යුතු ය:—

(අ) පැමිණිලි කොට ඇත්තේ කවර කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහිව ද, එම කොන්ත්‍රාත්කරු වෘත්තීය නොසැලකිල්ල හෝ නිසි දක්ෂතා නොමැති වීම, චරිත දූෂණාත්මක වරදකට, දූෂණ ක්‍රියාවකට, වංචාවකට හෝ වංක ක්‍රියාවකට වරදකරු වී ඇද්ද යන්න;

(ආ) පැමිණිලි කොට ඇත්තේ කවර කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහිව ද, එම කොන්ත්‍රාත්කරු සිය කොන්ත්‍රාත් වගකීම් කඩකර ඇද්ද යන්න;

(ඇ) පැමිණිලි කොට ඇත්තේ කවර කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහිව ද, එම කොන්ත්‍රාත්කරුට ලියාපදිංචි සහතිකය නිකුත්කොට ඇත්තේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඔහු විසින් එම නියම සහ කොන්දේසි කඩකර ඇද්ද යන්න;

(ඈ) පැමිණිලි කොට ඇත්තේ කවර කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහිව ද, එම කොන්ත්‍රාත්කරු වංචාවෙන් හෝ කරුණු වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචිය ලබාගෙන ඇද්ද යන්න; හෝ

(ඉ) පැමිණිලි කොට ඇත්තේ කවර කොන්ත්‍රාත්කරුවෙකුට එරෙහිව ද, එම කොන්ත්‍රාත්කරු විසින් මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන කඩකර ඇද්ද යන්න හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වී ඇද්ද යන්න.

(3) මේ වගන්තිය යටතේ විනය කමිටුව විසින් කරනු ලබන එවැනි නිර්දේශයක් ලැබුණු විට, අධිකාරිය විසින්, මේ පනත යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි වීමේ සහතිකයක් තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

කොන්ත්‍රාත් කරුවකු ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම යනාදියට එරෙහිව වන අභියාචනා.

37. (අ) මේ පනත යටතේ කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම; හෝ

(ආ) යම් කොන්ත්‍රාත්කරුවකුට නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම; හෝ

(ඇ) මේ පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම

සම්බන්ධයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රතික්ෂේප කිරීම, තාවකාලික අත්හිටුවීම හෝ අවලංගු කිරීම තමා වෙත දැනුම් දුන් දිනයේ සිට දින තිහක් ඇතුළත, එම ප්‍රතික්ෂේප කිරීම, තාවකාලික අත්හිටුවීම හෝ අවලංගු කිරීමට එරෙහිව 52 වන වගන්තිය මගින් පිහිටුවන ලද අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි ය.

ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් හඳුනාගත් ඉදිකිරීම් වැඩවල සේවයේ නියුක්ත කිරීම.

38. (1) සෑම හඳුනාගත් ඉදිකිරීම් වැඩක්ම ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු විසින් තත්කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටියට සහ ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යා යුතු ය.

(2) අධිකාරිය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා නොගෙන යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් කිරීමට භාර ගනු

ලබන හෝ කරගෙන යන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

**විදේශීය කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම සහ සේවයේ නියුක්ත කිරීම.**

**39.** (1) සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවකු විසින් ම, ශ්‍රී ලංකාවේ යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුක්තවීමට පෙරාතුව කොන්ත්‍රාත්කරුවකු වශයෙන් තාවකාලික ලියාපදිංචියක් ලබාගත යුතු ය. එසේ ලියාපදිංචි වීමේ ක්‍රියාපටිපාටිය සහ එම ලියාපදිංචිය අලුත් කර ගැනීම නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින්, යම් විදේශීය කොන්ත්‍රාත්කරුවකු මේ වගන්තිය යටතේ අධිකාරියේ ලියාපදිංචි වී ඇත්නම් මිස එම කොන්ත්‍රාත්කරු යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක නියුක්ත කිරීම නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යම් හඳුනාගත් ඉදිකිරීම් කටයුත්තක නියුක්තවීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව සමග යම් ගිවිසුමකට එළඹ ඇති යම් විදේශීය කොන්ත්‍රාත්කරුවකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. එසේ වුව ද, අධිකාරිය විසින්, එම කොන්ත්‍රාත්කරුවන් සේවයේ යොදවන ආයතනවලින් මේ පනතේ 55 වන වගන්තියේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ යම් තොරතුරු ලබාගත හැකි අතර, එම ආයතන, මේ වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමකට අනුකූල විය යුතු ය.

**කොන්ත්‍රාත් කරුවන් නියාමනය කිරීම.**

**40.** අධිකාරිය විසින්, තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මේ පනත යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් නියාමනය කිරීම සඳහා නියාමන ක්‍රමවේදයක් පිහිටුවිය යුතු ය.

**දේපල සංවර්ධන කරුවන්ගේ නාමලේඛනය.**

**41.** අධිකාරිය විසින්, යම් තැනැත්තකු විසින් කාර්යාල වේලාවන්හි දී පරීක්ෂා කිරීම සඳහා ගෙවීමකින් තොරව ලබා ගත හැකි, දේපල සංවර්ධනකරුවන්ගේ නාමලේඛනයක් තම කාර්යාලයෙහි පවත්වාගෙන යා යුතු ය.

**දේපල සංවර්ධනකරුවන් ලියාපදිංචි කිරීමේ කාර්යපටිපාටිය සහ එම ලියාපදිංචිය අලුත් කිරීම.**

**42.** (1) දේපල සංවර්ධනකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් නියම කරනු ලබන ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි ගාස්තු ද සමග අධිකාරිය වෙත යොමු කළ යුතු ය.

(2) අධිකාරිය විසින්, අදාළ වෘත්තීයමය මණ්ඩල සහ දේපල සංවර්ධනකරුවන්ගේ සංවිධාන විමසා, තැනැත්තන් දේපල සංවර්ධනකරුවන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍ර

සලකා බැලීම සඳහා කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය. එම ලියාපදිංචි කිරීම සඳහා වන උපමාන නියම කරනු ලබන පරිදි විය යුතු ය.

ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සපයන්නන්ගේ නාමාවලිය.

**43.** අධිකාරිය විසින් සාදනු ලබන රීතිවලින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ උපාංග සපයන්නන්ගේ නාමාවලියක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය. එම නාමාවලිය කාර්යාල වේලාවන්හි දී ගෙවීමකින් තොරව යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ලබාගත හැකි විය යුතු ය.

බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ නාමාවලිය.

**44.** අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට දැනට තිබෙන බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණවල නාමාවලියක් පවත්වාගෙන යා යුතු ය. එම නාමාවලිය කාර්යාල වේලාවන්හි දී ගෙවීමකින් තොරව යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි විය යුතු ය.

## VII වන කොටස

### තාක්ෂණ විගණනය

තාක්ෂණ විගණනය.

**45.** (1) අධිකාරිය විසින්, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් අයිතිකරු විසින් හෝ යම් රාජ්‍ය සංවිධානයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත එම හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් තාක්ෂණ විගණනයක් කළ යුතු ය.

(2) එම තාක්ෂණ විගණනය සම්බන්ධයෙන් අයවිය යුතු ගාස්තුවල අනුප්‍රමාණ සහ ඒ සම්බන්ධ කාර්යපටිපාටිය නියම කරනු ලබන ආකාරයෙන් විය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා, "තාක්ෂණ විගණනය" යන්නෙන්:—

(අ) මේ පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකසන ලද හඳුනාගත් ඉදිකිරීම් වැඩවලට සම්බන්ධ ප්‍රලේඛන හා අනුකූල වීම;

(ආ) මේ පනතේ විධිවිධානවලට සහ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව හඳුනාගත් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ගිවිසුමේ දක්වා ඇති පාර්ශවයන් විසින් ගිවිසුම යටතේ ඔවුන්ගේ නියමිත බැඳීම්වලට අනුකූලව ක්‍රියාකිරීම; සහ

(ඈ) කාර්යක්ෂම සම්පත් සහ බලශක්ති උපයෝජන ප්‍රමිතීන් ඇතුළත් වන්නා වූ මූලික මහජන සෞඛ්‍ය, වෘත්තීයමය සෞඛ්‍ය සහ පාරිසරික ප්‍රමිතීන් සහ තාක්ෂණ ප්‍රමිතීන් හා අනුකූල වීම.

යන කරුණු සත්‍යයේක්ෂණය කිරීම සඳහා ඉදිකිරීම් ක්‍රියාදාමය සහ කළමනාකරණ පටිපාටිය මෙන්ම අවසන් නිෂ්පාදනය ඇතුළත් වන්නා වූ හඳුනාගත් ඉදිකිරීම් වැඩ පරීක්ෂා කිරීම සහ ගිවිසුමට අදාළ ලේඛන සහ ගිවිසුම මත කරනු ලබන ලෙස ඉල්ලා ඇති ගෙවීම්වලට සම්බන්ධ ලේඛන පරීක්ෂා කිරීම ද අදහස් වේ

(4) අධිකාරිය විසින්, තාක්ෂණ විගණනය සිදු කිරීමේ කාර්යය සඳහා ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීමත් ඔවුන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යෑමක් කළ යුතු ය. අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ පටිපාටිය සහ එම විගණකවරුන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් අධිකාරිය විසින් සාදනු ලබන රීතිවලට අනුව නිශ්චය කළ යුතු ය.

## VIII වන කොටස

## ප්‍රමිති ලේඛන සහ මානව සම්පත් සංවර්ධනය

අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලබන ප්‍රමිති ලේඛන භාවිත කළ යුතු බව.

**46.** යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සඳහා උපදේශකයකු ලෙස හෝ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු ලෙස සුදුසුකම්ලත් තැනැත්තකු යොදා ගන්නා යම් පාර්ශවයක් විසින්, තත්කාර්ය සඳහා අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ප්‍රමිති ලේඛන යොදා ගත යුතු ය.

මානව සම්පත් සංවර්ධනය.

**47.** අධිකාරිය විසින්—

(අ) පුහුණු කිරීම මගින් සුදුසුකම් සහිත ඉදිකිරීම් සේවක පිරිස සඳහා වූ අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා ක්‍රමෝපාය වර්ධනය කළ යුතු ය;

(ආ) ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් සුසාධනය කිරීම හෝ පුහුණු කටයුතු පැවැත්වීම කළ යුතු ය;

(ඇ) නිපුණතා සහ ජාතික වෘත්තීය පරීක්ෂණ පිළිබඳ ජාතික ප්‍රමිති වර්ධනය කිරීම සුසාධනය කළ යුතු ය;

(ඈ) අලුතින් බිහිවන වෘත්තීන් සඳහා විෂයයමාලා සංවර්ධනය සඳහා පහසුකම් සැලසිය යුතු ය;

(ඉ) ඉදිකිරීම් පුහුණුව පිළිබඳව තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා යෝජනාක්‍රමයක් සකස් කළ යුතු ය;

(ඊ) පුහුණුව, මිනිස්බල අවශ්‍යතා සහ ඊට අදාළ කාරණාවලට සම්බන්ධ සමීක්ෂණ පැවැත්විය යුතු ය;

(උ) ඉදිකිරීම් සේවකයන් පිළිබඳ සමාජීය පිළිගැනීම වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සුසාධනය කළ යුතු ය;

(ඌ) ඉදිකිරීම් කර්මාන්තයේ මානව සම්පත් අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම් සේවකයන් සඳහා වූ රැකියා මාර්ගයක් වර්ධනය කිරීම සුසාධනය කළ යුතු ය;

(එ) සුදුසුකම්ලත් තැනැත්තකුගේ සහභාගීත්වයක් නොමැතිව යම් තනිපුද්ගල කොන්ත්‍රාත්තුවකට එළඹෙන ලියාපදිංචි ශිල්පීන් සහ කුඩා පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ට සහායවීම සඳහා කොන්ත්‍රාත්තු ලේඛන සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය සංවර්ධනය කිරීම කළ යුතු ය; සහ

(ඒ) කොන්ත්‍රාත්තු ලේඛන සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැලසීම කළ යුතු ය.

නිපුන තැනැත්තන්.

**48.** (1) අධිකාරිය විසින්, කලින් කල, සාදනු ලබන රීති මගින් නිශ්චය කළ හැකි යම් ශිල්පයක නිපුනතාවක් සතු තැනැත්තන්ට හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා අධිකාරිය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) අධිකාරිය විසින් එම ඉල්ලුම්කරුගේ හැකියාව සහ දක්ෂතාවය සැලකිල්ලට ගනිමින් (මෙහි මින් මතු "ශිල්ප හැඳුනුම්පත" යනුවෙන් සඳහන් කරනු ලබන) හැඳුනුම්පතක් අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන ආකෘතිය සහ ආකාරයට, එම ශිල්ප හැඳුනුම්පත දරන්නාගේ කාණ්ඩය සහ ශ්‍රේණිය නිශ්චිතව සඳහන් කරන හඳුනාගැනීමේ අංකයක් ද සහිතව නිකුත් කළ හැකි ය.

(3) ශිල්ප හැඳුනුම්පතක් දරන්නකු හැර වෙනත් කිසිම තැනැත්තකු, අදාළ ශිල්පය සම්බන්ධ ශිල්ප හැඳුනුම්පතක් දරන්නකුගේ අධීක්ෂණය යටතේ මිස, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක ස්වාධීනව නියුක්ත නොවිය යුතු ය.

(4) ව්‍යාජ හෝ අසත්‍ය ශිල්ප හැඳුනුම්පතක් වෙනත් යම් තැනැත්තකුට ඉදිරිපත් කරන හෝ එවැනි ශිල්ප හැඳුනුම්පතක් හෝ ලේඛනයක් තමා සන්තකයේ තබා ගනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(5) යම් ශිල්ප හුඳුනුම්පත් දරන්නකු සිය සේවා ස්ථානයෙහි, අවස්ථාවෝචිත පරිදි, "ලියාපදිංචි ශිල්පකරු" හෝ "ලියාපදිංචි ප්‍රධාන ශිල්පකරු" යන යෙදුම අඩංගු පුවරුවක් පැහැදිලිව පෙනෙන ලෙස, ප්‍රදර්ශනය කර තැබීමට හිමිකම් ලබන්නේ ය.

(6) ශිල්ප හැඳුනුම්පත් නිකුත් කිරීම සහ එම ශිල්ප හැඳුනුම්පත් දරන්නන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය සම්බන්ධයෙන් අදාළ වන කොන්දේසි නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(7) යම් අවශ්‍ය අංශයක අවශ්‍ය වන්නා වූ කුසලතා දේශීය වශයෙන් ලබාගත හැකි යම්, අධිකාරිය විසින්, ඒ සම්බන්ධයෙන් කිසිම විදේශීය ශිල්පියකු යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක සේවයේ යෙදීම සඳහා අනුමතය ප්‍රදානය නොකළ යුතු ය.

(8) අධිකාරිය විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතයට යටත්ව, මෙම පනත යටතේ ලියාපදිංචි වී ඇති ශිල්පීන් සඳහා සංවර්ධන අරමුදල මෙම පනත යටතේ ප්‍රයෝජනයට ගනිමින් යම් දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පුවක් හෝ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයක් සඳහා වැඩපිළිවෙලක් සකස් කළ හැකි ය.

(9) අධිකාරිය විසින්, ශිල්ප හැඳුනුම්පත් දරන්නන්ගේ නාම ලේඛනයක්, අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියට සහ ආකාරයට පවත්වාගෙන යා යුතු ය. එම නාමලේඛනය ගෙවීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු ය.

නිපුන ඉදි කිරීම් වැඩකරුවන්, ඉදි කිරීම් වැඩ බිම් අධීක්ෂක වරුන් සහ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන්ගේ නාමලේඛනය.

**49.** (1) අධිකාරිය විසින්, නිපුන ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකයන් සහ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන්ගේ නාම ලේඛනයක් නියම කරනු ලබන පරිදි පවත්වාගෙන යා යුතු අතර, එය ගෙවීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු ය.

(2) නිපුන ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන් සහ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන් ලියාපදිංචි කිරීම විවිධ නිපුනතාවලට අනුව සිදුකළ යුතු අතර, ලියාපදිංචි කිරීමේ සහ එම ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාපටිපාටිය අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

## IX වන කොටස

### ආරවුල් විසඳීම

අධිකාරිය විසින් සමාදාන කිරීම හෝ සමථ කිරීම් මගින් ආරවුල් විසඳීම.

**50.** ඉදිකිරීම් වැඩ සඳහා වන ගිවිසුමකට සම්බන්ධ යම් ආරවුලක්, එම ගිවිසුමේ ඒ සම්බන්ධයෙන් විධිවිධාන සලසා නැතිනම්, අධිකාරිය විසින්, එම ආරවුල, සමාදාන කිරීම හෝ සමථ කිරීම මගින් විසඳීම පාර්ශ්වයන්ගේ අභිලාෂය වන්නේ නම්, එසේ කළ හැකි වන්නේ ය.

විනිශ්චය කිරීම සඳහා යොමු කිරීමේ අයිතිවාසිකම්.

**51.** (1) යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩකට අදාළ කොන්ත්‍රාත්තුවක පාර්ශ්වයක් විසින්, යම් ආරවුලක්, සාමදාන කිරීම හෝ සමථ කිරීම මගින් විසඳීමට අධිකාරියට නොහැකිවන්නේ නම්, එකී ආරවුල විනිශ්චය කිරීමක් සඳහා යොමු කිරීම කළ හැකි වන්නේ ය.

(2) මේ වගන්තිය යටතේ යම් ආරවුලක් විනිශ්චය කිරීම සඳහා වන පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "ආරවුල" යන්නට හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුවක යම් පාර්ශවයන් අතර මත පිළබඳව වන යම් වෙනස්කමක් ද ඇතුළත් වේ.

තීරකවරුන්ගේ නාම ලේඛනය.

**52.** (1) ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් ගිවිසුමකට අදාළ ආරවුල් විනිශ්චය කිරීම සඳහා යෝග්‍ය තීරකවරුන්ගේ නාමලේඛනයක් අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන ආකෘතිය සහ ආකාරය අනුව අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය. තීරකවරුන්ගේ නාම ලේඛනය ගෙවීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු ය.

(2) එම තීරකවරුන් ලියාපදිංචි කිරීමේ සහ එම ලියාපදිංචිය අලුත් කිරීමේ පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

## X වන කොටස

## අභියාචනා මණ්ඩලය

අභියාචනා මණ්ඩලය පිහටුවීම.

**53.** (1) මේ පනතේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින් අධිකාරියේ නිර්දේශය මත පත් කරනු ලබන හත් දෙනෙකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත අභියාචනා මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. අභියාචනා මණ්ඩලයේ සියලු සාමාජිකයන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවුරුදු විස්සකට නොඅඩු පළපුරුද්දක් සහිත, මේ පනතේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම්ලත් තැනැත්තන් විය යුතු ය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට නියම කරනු ලබන ආකාරයට අභියාචනා මණ්ඩලය වෙත අභියාචනය කළ හැකි ය.

(3) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය හැකි අතර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(4) අභියාචනා මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම සම්බන්ධයෙන් 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(5) අභියාචනා මණ්ඩලය විසින්, තම සාමාජිකයන් අතුරින් පත්කර ගනු ලබන ලේකම්වරයකු අභියාචනා මණ්ඩලයට සිටිය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

(7) අභියාචනා මණ්ඩලයට, මේ පනතේ විධිවිධානවලට යටත් ව, එහි රැස්වීම්වල කාර්යපටිපාටිය සහ එහි වැඩ කටයුතු කළ යුතු ආකාරය විධිමත් කරගත හැකි ය.

අභියාචනා විමසා තීරණය කිරීම.

**54.** (1) අභියාචනා මණ්ඩලයට කරනු ලබන සෑම අභියාචනයක්ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතු අතර, අභියාචනය කරනු ලබන්නේ කවර තීරණයකට එරෙහිව ද, එම තීරණයේ පිටපතක් ද සමග එවිය යුතු ය;

(ආ) එම අභියාචනය සඳහා වන හේතු නිවැරදිව දැක්විය යුතු ය; සහ

(ඇ) අධිකාරියේ තීරණයේ දින සිට දින තිහක් ඇතුළත අභියාචනා මණ්ඩලයේ ලේකම්වරයා වෙත යැවිය යුතු ය.

(2) අභියාචනයක්, අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුට නොඅඩු ගණනක් විසින් විමසිය යුතු ය.

(3) අභියාචනා මණ්ඩලයේ ලේකම්වරයා විසින් අභියාචනයක් ලැබුණු විට, එම අභියාචනය විමසීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතු අතර, අභියාචකට සහ මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් දින දාහතරක දැනුම් දීමක් කළ යුතු ය.

(4) සෑම අභියාචකයකුම, අභියාචනා මණ්ඩලය ඉදිරියේ තනිවම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පෙනී සිටිය යුතු ය.

(5) අභියාචන මණ්ඩලය විසින් අභියාචනයක් විමසීමෙන් පසු, එම අභියාචනය අභියාචන මණ්ඩලයට ලැබුණු දින සිට මාස දෙකක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර, අභියාචනය කරන ලද්දේ යම් තීරණයකට එරෙහිව ද, එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතිවර්ථනය කිරීම කළ හැකි ය.

(6) අභියාචන මණ්ඩලයේ තීරණය සහ ඒ සඳහා හේතු අභියාචකට සහ අධිකාරියට ලිඛිතව දැන්විය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ කරන ලද අභියාචනයක් සම්බන්ධව අභියාචනා මණ්ඩලයේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින්, අභියාචක වෙත එම තීරණය සහ ඒ සඳහා හේතු දැනුම් දුන් දින සිට දින තිහක් ඇතුළත දී එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනා කළ හැකි ය.

## XI වන කොටස

### ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ තොරතුරු රැස්කිරීම. සකස් කිරීම සහ බෙදාහැරීම

*ඉදිකිරීම් කර්මාන්තය සඳහා අධිකාරිය විසින් ජාතික දත්ත මූලාශ්‍රයක් පවත්වාගෙන යා යුතු බව.*

55. (1) (මෙහි මින්මතු "තොරතුරු ලේකම් කාර්යාලයක්" යනුවෙන් හඳුන්වනු ලබන) කැපවූ තොරතුරු ලේකම් කාර්යාලයක් පවත්වාගෙන යෑම අධිකාරියේ වගකීම වන අතර, ඒ සඳහා අධිකාරියේ තොරතුරු ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) තොරතුරු ලේකම් කාර්යාලයේ කර්තව්‍ය, කාර්යපටිපාටිය සහ කාර්යසාධන ප්‍රමිති නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) තොරතුරු සඳහා උපදෙස් ලබාදීමට සහ තොරතුරු ඉල්ලා සිටීමට අධිකාරියට පහත දැක්වෙන අකාරයට බලය ඇත්තේ ය.

(අ) සියලු රාජ්‍ය සහ පුද්ගලික බැංකුවලින් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ඉදිකිරීම් කාර්යයක් සඳහා වාර්ෂිකව ප්‍රදානය කරන ලද සමස්ථ මූල්‍ය පහසුකම් සම්බන්ධයෙන්; එසේ වුව ද, එම ව්‍යාපෘති සහ එම ඉදිකිරීම් වැඩවල නියුතු තැනැත්තන් අනාවරණය නොකළ හැකි ය;

(ආ) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉදිකිරීම් කටයුතු සඳහා නිකුත් කරන ලද ණය මුදල් ප්‍රමාණයන් සහ ප්‍රදානයන් ගණන සම්බන්ධයෙන්; එසේ වුව ද, එම ව්‍යාපෘති සහ එම ණය හෝ ප්‍රදානවල අර්ථලාභීන්ගේ නම් අනාවරණය නොකළ හැකි ය;

(ඇ) ශ්‍රී ලංකා රේගුවෙන්, ආනයනය සහ අපනයනය කළ සියලු ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රමාණය සම්බන්ධ තොරතුරු;

(ඈ) 1992 අංක 32 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ පිහිටුවන ලද පතල් හා භූ විද්‍යා සමීක්ෂණ කාර්යාංශයෙන් වැලි කැණීම සඳහා බලපත්‍ර දරන්නන් විසින් වෙළඳපළට සපයන ලද ගංගා වැලි සහ මුහුදු වැලි හා සම්බන්ධ සංඛ්‍යාලේඛන;

(ඉ) ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්වල හෝ ඉදිකිරීම් වැඩවල සෘජුවම යෙදී සිටින සියලු රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය නියෝජිත ආයතනවලින් අධිකාරිය විසින් ඉල්ලා සිටින ආකාරයට යම් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් නියමිත ආකෘතියකින් තොරතුරු;

(ඊ) සියලු සුදුසුකම්ලත් තැනැත්තන්, ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සහ දේපල සංවර්ධන කරුවන්ගෙන්, සම්පූර්ණ කරන ලද යම් ඉදිකිරීම් වැඩක් සම්බන්ධ තොරතුරු;

(උ) වෘත්තීය පුහුණු අධ්‍යක්ෂ-ජනරාල්වරයාගෙන්, ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ පුහුණු වැඩසටහන් සහ පුහුණු ප්‍රතිඵල පිළිබඳ විස්තර;

(ඌ) කුඩා සහ මධ්‍ය පරිමාන නිවාස ණය සහ ප්‍රදාන සපයනු ලබන සියලු රාජ්‍ය සහ ස්වේච්ඡා සංවිධානවලින්, එසේ නිකුත් කළ සැබෑ ණය හෝ ප්‍රදාන සංඛ්‍යාව සහ මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර, එසේ වුව ද, එම ණය හෝ දීමනාවල අර්ථලාභීන් අනාවරණය නොකළ හැකි ය; සහ

(එ) ඉදිකිරීම් වැඩ සඳහා අවසර සහ බලපත්‍ර ප්‍රදානය කරන සියලු පළාත් පාලන ආයතන සහ සියලු ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් අධිකාරිය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන පරිදි වූ යම් ඉදිකිරීම් වැඩ සම්බන්ධ විස්තර.

(4) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය ප්‍රකාරව තොරතුරු සඳහා වූ යම් ඉල්ලීමකට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(5) රටේ ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ වාර්ෂික වාර්තා පළකිරීම සඳහා සහ අධිකාරිය වෙත කරන ලද ලිඛිත ඉල්ලීම මත රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සහ පුද්ගලයන් වෙත තොරතුරු ව්‍යාප්ත කර හැරීම අධිකාරියේ වගකීම වන්නේ ය. අධිකාරිය විසින්, මෙම සේවාව සැපයීම සඳහා අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.

(6) තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් ප්‍රකාරව තොරතුරු හෙළිකරන ලෙස නියම කළහොත් මිස, අධිකාරිය විසින් සෑම අවස්ථාවකම මේ වගන්තිය යටතේ තමා වෙත සපයන ලද තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, යම් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්, නිෂ්පාදකයන් හෝ සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ පෞද්ගලික මූල්‍ය තත්ත්වයන් හා සම්බන්ධ තොරතුරු හඳුනාගැනීමට හේතු විය හැකි කිසිම තොරතුරක් අධිකාරිය විසින් ප්‍රසිද්ධ කිරීම හෝ වෙනත් යම් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකට සැපයීම සිදු නොකළ යුතු ය.

## XII වන කොටස

### සාමාන්‍ය

**56.** (1) (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන හෝ එවැනි විධිවිධානයකට හෝ නියෝගයකට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු; හෝ වැරදි.

(ආ) අධිකාරියේ සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු වෙමින් මේ පනත යටතේ සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කාර්ය කිරීමේ දී ලබාගත් යම් තොරතුරක්, එවැනි තොරතුරක් හෙළි කිරීමට පනත යටතේ ඔහුට බලය දී ඇති කාර්යයක් සඳහා හැර වෙනත් යම් කාර්යයක් සඳහා යම් තැනැත්තෙකුට හෙලි කරන අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු.

මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට සිර දඬුවමකට හෝ ඒ දඩය සහ සිර දඬුවම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ වන යම් වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලැබූ විට-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම් සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකුම; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය, සමාගමක් නම් එහි සෑම කොටස්කරුවකුම,

එම වරද සම්බන්ධයෙන් මේ පනත යටතේ වරදකරු වන්නේ ය:

එසේ වුව ද, එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එම සමාගමේ කොටස්කරුවකු එම වරද සිදුවීම වැළැක්වීම සඳහා සියලු නිසි උද්යෝගයෙන් කටයුතු කළ බව අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරන්නේ නම් එවැනි තැනැත්තකු එම වරදට වරදකරු නොවන ලෙස සැලකිය යුතු ය.

**57.** (1) අධිකාරිය විසින් රීති සෑදීම සඳහා මේ පනත යටතේ නියමිත හෝ බලය දී ඇති කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදීම කළ හැකි වන්නේ ය. රීති.

(2) අධිකාරිය විසින් සාදන ලද සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**58.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝගය එසේ පළ

කරන ලද දිනයෙහි හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු මාස හයක් ඇතුළත, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

බලතල අභිනියෝජනය කිරීම.

**59.** (1) අධිකාරිය විසින්, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ අධිකාරිය වෙත පවරා ඇති යම් බලතල ලිඛිතව නිශ්චිත වශයෙන් දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව අධිකරියේ යම් නිලධරයකු වෙත අභිනියෝජනය කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් අභිනියෝජනය කිරීමක කුමක් සඳහන් වුව ද, එසේ අභිනියෝජනය කරන ලද යම් බලතල, අධිකාරිය විසින් නොකඩවා ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීමේ බලය.

**60.** (1) අධිකාරියේ හෝ තත්කාර්ය සඳහා අධිකාරිය විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධරයකුට යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් කරන ලද පැමිණිල්ලක් ලැබුණු විට. යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් කරගෙන යනු ලබන පරිශ්‍රයකට හෝ යම් සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් වැඩක පරිශ්‍රයට එම හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් යම් සමීක්ෂණයක්, විභාගයක් හෝ විමර්ෂණයක් කිරීමේ කාර්ය සඳහා, සාධාරණ හේතු මත, තමා හඳුනාගැනීමේ යම් සහතිකයක් ඉල්ලා සිටී නම්, එය ඉදිරිපත්කොට දවසේ යම් සාධාරණ වේලාවක දී එම ඉඩමට හෝ පරිශ්‍රයට ඇතුළුවීමට බලය ඇත්තේ ය.

(2) එම හඳුනාගත් ඉදිකිරීම් වැඩෙහි අයිතිකරු හෝ පදිංචිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් එවැනි සමීක්ෂණයක්, විභාගයක් හෝ විමර්ෂණයක් පැවැත්වීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, අධිකාරිය විසින්, එම ඉඩමට හෝ පරිශ්‍රයට ඇතුළුවීම සහ මහෙස්ත්‍රාත් අධිකරණයකින් නිකුත් කරන සෝදිසි වරෙන්තුවකින් අධිකාරිය වෙත පවරනු ලබන සියලු හෝ යම් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයකින් එවැනි සෝදිසි වරෙන්තුවක් ලබාගත යුතු ය.

අධිකාරියට බාධා කිරීම හෝ අවහිර කිරීම යනාදිය.

**61.** (1) 60 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ඉඩමකට හෝ පරිශ්‍රයක භාරකාරත්වය දරන කිසිම තැනැත්තකු විසින් අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු 60 වන වගන්තිය යටතේ සිය කාර්ය හෝ කර්තව්‍ය නීත්‍යානුකූලව කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එම නිලධරයාට හෝ සේවකයාට දැන දැනම හෝ කැමැත්තෙන් ම හෝ බාධා කිරීම හෝ අවහිර කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**62.** අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**63.** අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩුවල දී දරන ලද වියදම්.

**64.** (1) යම් අධිකරණයක් ඉදිරියේ, අධිකාරිය විසින් හෝ එයට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු

අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහු විසින් හෝ ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව හෝ නොකර හැරීම සද්භාවයෙන් කරන ලද්දක් බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගනු ලැබුවේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතුය.

ඉවත් කිරීම සහ ඉතිරි කිරීම.

**65.** (1) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද අංක 718/15 සහ 1992 ජූනි මස 10 වන දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී ඉවත් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නිකුත් කරන ලද අංක 718/15 සහ 1992 ජූනි මස 10 වන දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවන ලද ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ අදාළ විශ්‍රාම වයස්වලට එළඹ නොමැති සියලු සේවකයන්ට නියමිත දිනයේ දි නියමයේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නිශ්චිතව දක්වා ඇති දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එම සේවකයන්ට අදාළ වූ සේවා නියම සහ කොන්දේසිවලට අඩුවෙන් වාසි සහගත නොවන සේවා නියම සහ කොන්දේසි මත අධිකාරියේ සේවා නියුක්තිය පිරිනමනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ දක්වා ඇති, අධිකාරියේ සේවා නියුක්තිය පිරිනමන ලදුව එය භාර නොගැනීමට තීරණය කරන යම් සේවකයකු අධිකාරියේ සේවා නියුක්තිය පිරිනැමීම සම්බන්ධයෙන් ඔහුට දැනුම් දුන් දිනයේ සිට මාස තුනක් ඇතුළත එසේ සේවයෙන් ඉවත්ව යා හැකි ය. (2) වන උපවගන්තියේ දක්වා ඇති එවැනි යම් සේවකයකු

ඔහුට පිරිනමන ලද සේවා නියුක්තිය භාර නොගන්නේ නම්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන ස්වේච්ඡා විශ්‍රාම යෝජනාක්‍රමයක් යටතේ ඔහුට වන්දි ගෙවනු ලැබිය යුතු ය.

(4) ඉහත සඳහන් කල නියමය පරිච්ඡින්න කිරීම නොතකා-

(අ) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ සියලු වංචල සහ නිශ්චල දේපල (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු ය;

(ආ) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් හෝ ඒ සමග ඇති කරගත් සහ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී පවතින්නා වූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, අධිකාරිය විසින් හෝ ඒ සමග ඇති කරගත් කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් හෝ ඊට එරෙහිව ගොනු කරන ලදුව, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී තීරණය නොවී පවතින සියලු නඩු, ක්‍රියා සහ වෙනත් නීතිකෘත්‍ය ඉහත කී නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක වන පරිදි, අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු, ක්‍රියා සහ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) ඉහත කී නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ පැවැති සියලු අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ඉහත කී නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක වන පරිදි අධිකාරියේ අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාසියට හෝ ඊට එරෙහිව කවර හෝ නිසි බලය ඇති අධිකරණයක් විසින් ඇතුළත් කරන ලද සහ ඉහත කී නියමයේ නිශ්චිතව

දක්වා ඇති දිනයේ දී ඉටු නොකර ඉතිරිව ඇති සෑම තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක්ම, එම දිනයේ සිට බලාත්මක වන පරිදි අධිකාරියේ වාසියට හෝ ඊට එරෙහිව ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කළ යුතු ය.;

(5) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ සියලු ප්‍රකාශන සහ ලේඛන අධිකාරියේ ප්‍රකාශන සහ ලේඛන ලෙස බලාත්මකව පැවතිය යුතු අතර, ඒවා අධිකාරියේ ප්‍රකාශන සහ ලේඛන ලෙස සැලකිය යුතු ය.

අනුකූලතාවයක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**66.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**67.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"ඉදිකිරීම් වැඩ" යන්නෙන්, පහත දක්වා ඇති කවර හෝ විස්තරයකට අයත් දෙයක ක්‍රියාකාරකම් අදහස් වේ; එනම්—

(අ) (ස්ථිර හෝ ස්ථිර නොවූ) ඉඩම හෝ එහි කොටසක් සංයුක්ත කරන්නා වූ යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක්, ඉදිකිරීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, විශාල කිරීම, බිඳහෙලීම හෝ ගලවා දැමීම;

(ආ) ඉඩමේ හෝ එහි කොටසක් සංයුක්ත කරන්නා වූ යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් ඉදිකිරීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, විශාල කිරීම, බිඳහෙලීම හෝ ගලවා දැමීම (ඉහත දක්වා ඇති කිසිවකට කිසියම් අගතියක් නොවන පරිදි) ආදී වශයෙන් තාප්ප, මාර්ග වැඩ, විදුලි මාර්ග, විදුලි සංදේශ උපකරණ, ගුවන් යානා ධාවන පථ, නැව් තටාක සහ වරාය, මාර්ග, දුම්රිය මාර්ග, අභ්‍යන්තර ජල මාර්ග, නල මාර්ග, ජලාශ, ජල සැපයුම් මාර්ග, ළිං, මළාපවහන මාර්ග, ජල සම්පාදනය සහ ජලාපවහනය, වෙරළ සංරක්ෂණය හෝ රාජ්‍ය ආරක්ෂාව යන කාර්ය සඳහා අවශ්‍ය කර්මාන්ත පිරියත සහ සවිකිරීම;

(ඈ) ඉහත සඳහන් කිසිවකට අගතියක් නොවන පරිදි, යම් ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක, උණුසුම් කිරීමේ පද්ධති, ආලෝකකරණය, වායුසමීකරණය කිරීම්, වායු සංසරණය කිරීම්, විදුලි සැපයුම, ජලාපවහන, සනීපාරක්ෂණය, ජල සම්පාදන හෝ ගිනි ආරක්ෂණය හෝ සුරක්ෂණය හෝ සන්නිවේදන පද්ධති අතුළු ඉඩමේ කොටසක් සංයුක්ත කරන්නා වූ තිරවුරු සවි කිරීම;

(ඇ) ඉදිකිරීමේ, වෙනස් කිරීමේ, අලුත්වැඩියාවේ, ව්‍යාප්ත කිරීමේ හෝ ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු කරගෙන යන තාක් දුරට ඒ අතරතුර දී ගොඩනැගිලි හෝ නිර්මිතවල බාහිර හෝ අභ්‍යන්තර පිරිසිදු කිරීම්;

(ඉ) වැඩබිම හෙලි පෙහෙලි කිරීම, පස් කැපීම, කැණීම් කටයුතු, උමං කැණීම, සහ විදීම්, අත්තිවාරම් දැමීම, පලංචි සවි කිරීම, ආධාරක නඩත්තු කිරීම හෝ ගැලවීම, වැඩබිම ප්‍රතිස්ථාපනය කිරීම, බිම් සැකසීම සහ ප්‍රවිෂ්ට මාර්ග සහ අනෙකුත් ප්‍රවේශ ලබාදීම අතුළු මේ වගන්තියේ මීට පෙර විස්තර කරන ලද පරිදි ප්‍රධාන කොටසක් වන හෝ ප්‍රාරම්භක වන හෝ සම්පූර්ණ කිරීම සඳහා වන ක්‍රියාකාරකම්;

(ඊ) යම් ගොඩනැගිල්ලක හෝ ව්‍යුහයක බාහිර හෝ අභ්‍යන්තර පෘෂ්ඨයන් ආලේපකරණය හෝ සැරසීම;

"ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව" යන්නෙන් පහත සඳහන් කවරක් හෝ සඳහා යම් තැනැත්තකු හෝ අස්තිත්වයක් සමග ඇති කරගන්නා ගිවිසුමක් අදහස් වේ:—

(අ) ඉදිකිරීම් වැඩ කරගෙන යාම;

(ආ) අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තාට හෝ අස්තිත්වයට උපකොන්ත්‍රාත්තුවක් මගින් හෝ වෙනත් අයුරකින්, වෙනත් අය මගින් ඉදිකිරීම් වැඩ කරගෙන යෑම සූදානම් කිරීම;

(ඇ) ඉදිකිරීම් වැඩ කරගෙන යෑම සඳහා එම තැනැත්තාගේ කම්කරුවන් හෝ අස්තිත්වය සතු හෝ වෙනත් අයගේ කම්කරුවන් ලබාදීම;

''කොන්ත්‍රාත්කරු'' යන්නෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් යටතේ ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කරන යම් තැනැත්තකු හෝ අස්තිත්වයක් අදහස් වේ;

''ඉදිකිරීම් කරන්නා'' යන්නෙන් තමා වෙනුවෙන්ම හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් තනිවම හෝ වෙනත් යම් ව්‍යාපාරයක් සමග සම්බන්ධව යම් ඉදිකිරීම් වැඩ කරගෙන යෑමට භාරගන්නා තැනැත්තකු අදහස් වේ;

''උපදේශකයා'' යන්නෙන් ඉදිකිරීම් වැඩ සඳහා ගිවිසුමක් යටතේ උපදේශක සේවා සපයනු ලබන යම් සුදුසුකම්ලත් තැනැත්තකු හෝ අස්තිත්වයක් අදහස් වේ;

''ප්‍රලේඛනය'' යන්නෙන් ප්‍රමාණ පත්‍ර, කොන්ත්‍රාත් ලේඛන, සැලසුම් සහ පිරිවිතර සහ වෙනත් යම් ටෙන්ඩර සහ කොන්ත්‍රාත්වලට අදාළ ලේඛන ද ඇතුළු ටෙන්ඩර සහ අර්පන ලේඛන සැකසීම අදහස් වේ;

''බාහිරව ආධාර සපයනු ලබන ව්‍යාපෘති'' යන්නෙන් භාණ්ඩගාරයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා යම් ණය දෙන හෝ දායක නියෝජ්‍යායතනයක් හෝ යම් විදේශ ආණ්ඩුවක් මගින් ආධාර සපයනු ලබන යම් ව්‍යාපෘතියක් ඇතුළත් වේ;

''හඳුනාගත් ඉදිකිරීම් වැඩ'' යන්නෙන්—

(අ) රුපියල් මිලියන දහය හෝ අමාත්‍යවරයා විසින් කලින් කළ නියම කරනු ලැබිය හැකි ඊට වඩා යම් වැඩි වටිනාමකින් යුක්ත වන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිතයන් හෝ මහජනයාගේ පාවිච්චිය සඳහා වන යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ බිම් සැකසුමක්; සහ

(ආ) පාරිසරික, භූවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුම නියාමන ආයතනවල අනුමතය අවශ්‍ය වන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිත හෝ බිම් සැකසීම්

අදහස් වේ.

යම් පෞද්ගලික අයිතිකරුවකුගේ පුද්ගලික පාවිච්චිය සඳහා ඉදිකරන ලද යම් පෞද්ගලික නේවාසික ගොඩනැගිල්ලක් "හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යන යෙදුමේ අර්ථ නිරූපනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය;

''නිමකරන ලද හඳුනාගත් ඉදිකිරීම් වැඩ'' යන්නෙන් නිමකිරීම් සහතිකයක් හෝ පාලනයට නතුකර ගැනීමේ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් අදහස් වේ;

''අමාත්‍යවරයා'' යන්නෙන් ඉදිකිරීම් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

''දේපල සංවර්ධනකරු'' යන්නෙන් ඉඩම්, ඉඩම් හිමිකාරත්වය, මුදල් සැපයීම, අලෙවිකරණය හෝ වෙනත් යම් අවශ්‍ය විශේෂඥභාවයක දායකත්වය ලබා ගනිමින් ඉදිකිරීම් කර්මාන්තයේ විශේෂයෙන් ම නිවාස අංශයේ යම් ව්‍යාපෘතියක් භෞතිකව හෝ සංකල්පනාත්මකව ප්‍රවර්ධනය කරන්නා වූ ව්‍යවසායයකු අදහස් වේ;

''සුදුසුකම්ලත් තැනැත්තා'' යන්නෙන් නියම කරනු ලැබිය හැකි පරිදි වූ අධිකාරිය විසින් අදාළ වෘත්තීයමය මණ්ඩලයේ අනුමතය ඇතිව අදාළ කරගනු ලබන, අදාළ නාමලේඛනයේ නම ඇතුළත් කොට ඇති යම් තැනැත්තකු අදහස් වේ;

''අධීක්ෂණය'' යන්නෙන් යම් ඉදිකිරීම් කටයුත්තක දී නිර්මාණයේ අන්තර්ගත ඉංජිනේරුමය සහ ගෘහ නිර්මාණ ශිල්පීයමය සංකල්ප සහ මතයන් නිවැරදිව යොදාගෙන ඇති බව තහවුරු කිරීම අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.